CA | THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

# SUGGESTED SOLUTIONS

03104 - කළමනාකරණය සහ ව්‍යාපාර ආර්ථික විද්‍යාව

ගිණුම්කරණ සහ ව්‍යාපාර සහතික පත්‍ර විභාගය - I
2013 සැප්තැම්බර්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

## <u>පිළිතුර අංක 01</u>

(අ) $Q_{(d)} = 200 - 1.25P$

$Q_{(s)} = -60 + 2P$

වෙළඳපල සමතුලිත මිලේදී $Q_{(d)} = Q_{(s)}$

එම නිසා, වෙළඳපල සමතුලිත වීමේදී ,

$200 - 1.25P = -60 + 2P$

$2P + 1.25P = 200 + 60$

$3.25P = 260$

වෙළඳපල සමතුලිත මිල, P = රු. <u>80.00</u>

වෙළඳපල සමතුලිත ප්‍රමාණය (ඉහත P අගය , $Q_{(d)}$ ශ්‍රිතයට හෝ $Q_{(s)}$ ශ්‍රිතයට ආදේශ කිරීමෙන්)

$Q = 200 - 1.25(80.00) =$ <u>100 කිලෝග්‍රෑම්</u>

(ආ) අර්තාපල් කිලෝග්‍රෑම් එකකට පනවන ලද තීරු බද්ද = රු. 16.25

තීරුබද්දට ප්‍රථම සැපයුම් මිළ, $2P_{(s)} = Q + 60$

$P_{(s)} = 0.5Q + 30$

තීරුබද්දට ප්‍රථම ඉල්ලුම් මිළ, $1.25P_{(d)} = 200 - Q$

$P_{(d)} = (200/1.25) - (Q/1.25)$

$P_{(d)} = 160 - 0.8Q$

තීරුබද්දට පසු සැපයුම් මිළ, $P1_{(s)} = P_{(s)}$ + රු. 16.25

$P1_{(s)} = (0.5Q + 30) + 16.25$

තීරුබද්දට පසු , වෙළඳපල සමතුලිතාවය, $P1_{(s)} = P_{(d)}$

එනම්, $(0.5Q + 30) + 16.25 = 160 - 0.8Q$

$0.5Q + 0.8Q = 160 - 30 - 16.25$

$1.3Q = 113.75$

වෙළඳපල සමතුලිත ප්‍රමාණය, $Q = 113.75 / 1.3 =$ කිලෝග්‍රෑම් 87.5

වෙළඳපල සමතුලිත වීමේදී, සමතුලිත මිල :( ඉහත Q අගය, ආදේශ කිරීම මගින්)

තීරුබද්දට පසු වෙළඳපල සමතුලිත මිළ,

$= (0.5)(87.5) + 30 + 16.25 =$ රු. <u>90.00</u>

(ඇ) වෙළඳපල එළවළු මිල ගණන් උච්ජාවචනය වීමට හේතු :

එළවළු වෙළඳපලේ, ඉල්ලුමේ මිල නම්‍යතාවය, බොහෝ දුරට අනම්‍ය තත්වයක් වීම යටතේ,

(i) යහපත් හෝ අයහපත් කාලගුණික තත්වයක් පැවතීම හේතුවෙන්, අදාල පරිදි, ඉහල අස්වැන්නක් හෝ පහල අස්වැන්නක් ලැබීම හේතුවෙන්, සෘතුමය වශයෙන් සමස්ථ වෙළඳපල සැපයුම් ඉහලයාම හෝ පහත වැටීම.

(ii) අධික වර්ෂාපතනයක් ලැබීම හේතුවෙන්, ගංවතුර තත්වයක් ඇතිවීම නිසා, රැස්කරන තත්වයක පැවති අස්වැන්නට හානි සිදුවීමෙන් හෝ ප්‍රවාහන බාධා ඇතිවීම හේතුවෙන්, අනපේක්ෂිත පරිදි වෙළඳපල එළවළු සැපයුමේ ඌනතාවයක් ඇතිවීම.

(iii) සමහර එළවළු සඳහා වෙළඳපලෙහි හොඳ මිලක් අත්දකින විට, තනි තනිව සිය නිෂ්පාදන තීරණ ගන්නා ගොවීන්, එවන් එළවළු වගා කිරීම සඳහා තරණ ගැනීමෙන්, ඉදිරි කන්නයේදී එම නිෂ්පාදිතයන්හි සැපයුම වැඩිවීම.

(iv) වගාකිරීමෙන් පසු අත්දකින්නට සිදුවන, වගා හානිකරන කෘමි වසංගත හා ලෙඩරෝග පැවතීම.

(v) එළවළු නිෂ්පාදිතයන්හි ආවේනික ලක්ෂණයක් වන, කල්තබා ගැනීමේ අපහසුතාවය සහ නිෂ්පාදන තීරණ ගැනීම සහ සත්‍ය නිෂ්පාදනය වෙළඳපලට සැපයීම අතර පවතින අනිවාර්ය කාල පමාව.

(ඈ) (i) " මිල යාන්ත්‍රණය" - ඉල්ලුම සහ සැපයුම යන වෙළඳපල බලවේග දෙකෙහි නැතහොත් මිලදී ගන්නන්ගේ සහ සැපයුම් කරුවන්ගේ වෙළඳ පල අන්තර් ක්‍රියාකාරීත්වයෙන්, භාණ්ඩ සහ සේවාවන්හි වෙළඳපල මිල ගණන් තීරණය වන ආකාරයයි.

(ii) මිල යාන්ත්‍රණයේ වාසි.

(අ) නිවැරදි නිෂ්පාදිතයෙන්, නිවැරදි ප්‍රමාණය තීරණය කර නිෂපාදනය කිරීමට අවශ්‍ය සම්පත් කාර්යක්ෂම ලස මුදාහැරීම සිදුකරන යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක වීම. ඒ අනුව, නිෂ්පාදකයන්, සිය නිෂ්පාදිතයන්ට හොඳ මිලක් ලබාගන්නා අතර, ගැනුම්කරුවන්ට සිය මුදලට හොඳ වටිනාකමක් ලැබේ.

(ආ) පාර්භෝගික අවශ්‍යතා සහ වරණයන් මත නිෂ්පාදිතය, එහි ගුණාත්මක බව, මිලගණන් යනාදිය තීරණය වන හෙයින්ද, ඒ අනුව එම තත්වය වෙළඳපල ඉල්ලුමට සෘජු බලපෑමක් කරන හෙයින්ද, මිල යාන්ත්‍රණය පාර්භෝගික ස්වාධිපත්‍යය ඇතිකිරීමට හේතුපාදක වේ.

(ඇ) පාර්භෝගිකයන්ට අවශ්‍යවන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා වන දිරිගැන්වීමක්, වෙළඳපල තුලින්, නිෂ්පාදකයන්ට ලබාදේ.

(ඇ) නිෂ්පාදන ක්‍රියාවලින් සඳහා අවශ්‍ය කුශලතා ලබාගැනීමට වෙළඳපල තුලින් දිරිගැන්වීමක් ලබා දේ.

(ඉ) හිඟ සම්පත් සංරක්ෂණය සඳහා, මිල ක්‍රමය මගින්, නිෂ්පාදකයන් මෙන්ම පාර භෝගිකයන් දිරිගන්වයි.

(ඊ) පිරිවැය අඩුකරගනිමින්, නිෂ්පාදනය නංවාගෙන ව්‍යාපාර කාර්යක්ෂමතාවය පවත්වා ගැනීමට තරගකාරීත්වය මගින් උනන්දු කරවයි.

(iii) මිල යන්ත්‍රණයේ අවාසි.

(අ) මිල යාන්ත්‍රණය මගින් සම්පත් බෙදාහැරීම තීරණය වන තත්වයන් යටතේ, ප්‍රසිද්ධ/උපයෝගතා (Public) භාණ්ඩ නිෂ්පාදනය සඳහා දිරිගැන්වීමක් සිදුනොවේ. ඒ අනුව එවැනි භාණ්ඩ නිෂ්පාදනයක්, මිල යාන්ත්‍රණය යටතේ සිදු නොවේ.


(ආ) මිල යාන්ත්‍රණය යටතේ, සමහරක් භාණ්ඩ නිෂ්පාදනය අඩුවෙන් සිදුවිය හැකිය. (Under - produced) අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි සේවා සැම දෙනාට පොදුවේ අවශ්‍යවුවත්, මිල යාන්ත්‍රණය මගින් එම නියම ඉල්ලුම පිළිඹිබු නොවීම නිසාත්, ක්‍රය ශක්තිය ඇති අය පමණක් ඉලක්ක කර ගනිමින් එකී නිෂ්පාදන සැපයීම සිදුවීමත් හේතුවෙන් එකී තත්වය ඇතිවේ.

(ඇ) සම්පත් විෂම ලෙස (Less equally) බෙදියාම සිදුවීම. ප්‍රමාණවත් ආදායම් ඇති පාර්ශවයන් , වෙළඳපල භාණ්ඩ මිලදී ගැනීමට හැකියාව ලබන හෙයින් , අඩු ආදායම් ලාභීන්ගේ අවශ්‍යාවයන්ට වඩා, ඉහළ ආදායම්ලාභීන්ගේ අවශ්‍යතා සඳහා වැඩි සම්පත් බෙදියාමක් මෙහිදී සිදුවේ.

## පිළිතුර අංක 02

(අ) පහත දැක්වෙනුයේ, A සහ B යන භාණ්ඩ දෙකෙන්, විවිධ සංයෝජනයන්ගෙන් ලබාගත හැකිවන උපයෝගිතා මට්ටම් තුනක් පෙන්වන උපේක්ෂා වක්‍ර තුනකින් යුත්ත රූප සටහනකි.

B භාණ්ඩය (ඒකක)




A භාණ්ඩය (ඒකක)

$U_1$, $U_2$ සහ $U_3$ යන උපෙක්ෂා වක්‍ර තුනෙන්, එකිනෙකට වෙනස් උපයෝගිතා මට්ටම් තුනක් පෙන්වාදෙයි. ඒ අනුව $U_3$ යටතේ , යම් ලක්ෂයකට අදාල A සහ B යන භාණ්ඩ දෙකෙහි සංයෝජනයකින් ලැබෙන උපයෝගිතාවය, $U_1$,හෝ $U_2$ යටතේ , ගැනෙන සංයෝජනයකින් ලබන උපයෝගිතාවයකට වඩා වැඩිය. වෙනත් අයුරකින් දැක්වුවහොත්, A සහ B යන භාණ්ඩ දෙකෙන් සැදුනු සංයෝජනයන්ගෙන් ලැබෙන උපයේගිතාවය අනුව, ඒ ඒ උපෙක්ෂා වක්‍රය නියෝජනය කරන උපයෝගිතා මට්ටම් පහත පරිදි ශ්‍රේණිගත (තරා) කළ හැකිය.

$U_3$ යටතේ උපයෝගිතාවය > $U_2$ යටතේ උපයෝගිතාවය > $U_1$යටතේ උපයෝගිතාවය

මේ අනුව, විවිධ උපයෝගිතා මට්ටම් නියෝජනය කරන උපයෝගිතා වක්‍ර දෙකක් එකිනෙක ඡේදනය වීම යනු එම වක්‍ර දෙකට අදාල උපයෝගිතා මට්ටම් එක හා සමාන වන බවයි. එහෙත් ඉහත සදහන් තරා කිරීම අනුව එය කිසිසේත් සිදුවිය නොහැකිය. එසේ නම් එයින් කියවෙනුයේ, උපේක්ෂා වක්‍ර 2 ක්, කිසිවිටකත් එකිනෙක ඡේදනය විය නොහැකි බවයි.

(ආ) භාණ්ඩ දෙකකින් සැදෙන විවිධ සංයෝජනයන්ගෙන් පාරිභෝගිකයෙකුට ලබාගත හැකිවන උපයෝගිතා මට්ටම් විදහා දැක්වීමක් උපේක්ෂා වක්‍ර මගින් සිදුවුවත්, එසේ වන්නේ භාණ්ඩ දෙකේ විවිධ සංයෝගයන් ඔහු වෙත ලබාදුනහොත් පමණි. සැබවින්ම, එම උපයෝගිතාවය පාරිභෝගිකයාට ලැබෙනුයේ, එම භාණ්ඩ සඳහා අදාල වන මිල ගණන් යටතේ, එම භාණ්ඩ සඳහා සංයෝජනයන් ලබාගැනීම සඳහා එම පාරිභෝගිකයාට මුදල් වැයකල හැකිවීමේ තත්ත්වය මතයි.

ඒ අනුව, සත්‍ය පරිභෝජනය තීරණයවනුයේ, භාණ්ඩ දෙක ලබාගැනීම සඳහා ඔහුට වෙන්කල හැක "අයවැය ලේඛණය" (Budget) මතයි. එනයින් ගත් විට මෙම කාර්යයේ දී ප්‍රධාන සීමාකාරී සාධකය

වනුයේ එකී "අයවැය ලේඛණයයි" එම නිසා එය "අයවැය සීමාකාර් සාධකය"(Budget Constraint) නම් වේ.

A සහ B වශයෙන් ගැනෙන භාණ්ඩ දෙකක මිලගණන් අනුපිලිවෙලින් රු. 5 සහ රු. 10 වශයෙන් වන්නේ නම් සහ පවත්නා අයවැය ලේඛණය රු. 100 කට සීමා වන්නේ නම්, මෙම පාර්භෝගිකයාට A සහ B යන භාණ්ඩ දෙකෙන් ලබාගත හැකි ප්‍රමාණය රු. 100/- ට සීමා වේ. එම නිසා එම සීමාකාර් සාධකය ඉක්මවා යන භාණ්ඩ මිලදී ගැනීමක් ඔහුට කල නොහැකිවේ. නිදසුනක් ලෙස, 10 A + 10 B යන භාණ්ඩ සංයෝජනය ඔහුට ලබාගත නොහැකි වනුයේ ඒ සඳහා රු. 150/- ක් අවශ්‍ය වන බැවිනි. ඒ අනුව, සත්‍ය පරිභෝජන රටාව තීරණය කිරීම සඳහා අයැය සීමාකාර් සාධකය සැලකිල්ලට ගැනීම අත්‍යවශ්‍ය වේ.


(ඇ) උපේක්ෂා වක්‍ර කුලකයක් දැක්වෙන ප්‍රස්ථාර සටහනක "අයවැය රේඛාව" (Budget Line) ලකුණු කිරීමෙන් අයවැය සීමාකාර් සාධකය විදහා දැක්විය හැකිය. මෙම අයවැය රේඛාව වෙතින්, භාණ්ඩ දෙක සඳහා පවත්නා මිල ගණන් යටතේ, පවත්නා අයවැය ලේඛණය භාවිතයට ගනිමින්, ලබාගත හැකි සියළුම භාණ්ඩ සංයෝජන පෙන්වා දෙයි.

මෙම අයවැය රේඛාව, ප්‍රස්ථාරයක සටහන් කලවිට, එය සරල රේඛාවක් ලෙස දිස්වේ. එම සරල රේඛාව, උපේක්ෂා වක්‍රයක් සමග ස්පර්ශවන ස්ථානයට අදාල භාණ්ඩ සංයෝජනය , ලබාගත හැකි හොදම භාණ්ඩ සංයෝජනය ලෙස දැක්විය හැකිය. අදාල සියළුම සාධක නොවෙනස්ව පවත්නා තාක් කල්, එම ලක්ෂ්‍යය සමතුලිත ලක්ෂ්‍යය ලෙස සැලකිල්ලට ගත හැකය.

ආදායම් මට්ටම වැඩිවීමක් සිදුවීමත් සමග, අයවැය රේඛාව දකුණට විතැන්වී, වෙනත් ඉහල මට්ටමක උපෙක්ෂා වක්‍රයක් සමග ස්පර්ශ වීමෙන්, පාර්භෝගිකයා වඩාත් ඉහල උපයෝගතා මට්ටමක් ලබාගනිමින් නව සමතුලිත තත්වයකට පත්වේ.

මෙම තත්වය පහත රූප සටහනින් පැහැදිලි කල හැකිය.

මෙහිදී , අයවැය රේඛා අංක 1 = අයවැය රු. 100/-
අයවැය රේඛා අංක 2 = අයවැය රු. 120/-
අයවැය රේඛා අංක 3 = අයවැය රු. 140/-




මෙහි U වලින් උපයෝගිතා වක්‍රයද E වලින් සමතුලිතතා ලක්ෂ්‍යයද පෙන්වයි.

(ඇ)(i) හරස් ඉල්ලුම් නම්‍යතාවය.

ආර්ථික විද්‍යාවේදී හරස් ඉල්ලුම් නම්‍යතාවය නැතහොත් ඉල්ලුමේ හරස් මිල නම්‍යතාවය යනු වෙනත් භාණ්ඩයක මිල වෙනස් වීමක් හේතුවෙන් යම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලමට ඇතිවන ප්‍රතිචාරය මැන දක්වන මිනුමයි. එහිදී මැන දක්වනුයේ වෙනත් භාණ්ඩයක මිලෙහි සිදුවන ප්‍රතිශතාත්මක වෙනසට ප්‍රතිචාර වශයෙන් යම් භාණ්ඩයක ඉල්ලුම වෙනස්වීමේ ප්‍රතිශතාත්මක අගයයි.

නිදසුනක් ලෙස, තිරිඟු පිටි මිලෙහි 10% ක වැඩිවීමක් හේතුවෙන් , ඊට ආදේශක භාණ්ඩයක් වන සහල් වල ඉල්ලුම 15% කින් වැඩිවේනම්, හරස් ඉල්ලුම් නම්‍යතාවය = (15% ÷ 10%) = + 1.5 කි.

හරස් ඉල්ලුම් නම්‍යතාවය ධන අගයක් ලෙස දැක්වේ නම්, එයින් අදහස්වනුයේ සලකා බැලෙන භාණ්ඩ දෙක එකිනෙකට ආදේශක භාණ්ඩ වේ යන්නයි. එම අගය ඍණ අගයක් ලෙස දැක්වේ නම් සලකා බැලෙන භාණ්ඩ දෙක, එකිනෙකට අනුපූරක භාණ්ඩ වේ. එකිනෙකට කිසිදු සමතාවයක් නැති භාණ්ඩ සඳහා වූ එම අගය ශුන්‍ය අගයක් වේ. නිදසුනක් ලෙස, බස් ගාස්තු වෙනස්වීම සහ සහල් සඳහා වන ඉල්ලුම අතර සබඳතාවය දැකිවිය හැකිය.

(ii) ආර්ථික විශ්ලේෂණයේදී මෙම සංකල්පයේ වැදගත් කම.

ව්‍යාපාරයකට, සිය නිෂ්පාදනය සඳහා වන හරස් ඉල්ලුම් නම්‍යතාවය නිවරදිව ගණනය කලහැකිවේ නම්, එමගින් , සිය තරඟකරුවන් සිදුකරන උපාය මාර්ගික මිල වෙනස්කිරීම් වල බලපෑම පිළිබඳ ඇගයීමක් කල හැකිවේ. එසේම එම තොරතුරු භාවිතයෙන්, සිය අනුපූරක භාණ්ඩ සඳහා යෝග්‍ය උපාය මාර්ගික මිල වෙනස් කිරීම් පිළිබඳ නිගමන වලටද එලඹිය හැකිවේ. නිදසුනක් ලෙස, වෙනත් භාණ්ඩ සමග අනුපූරක වන භාණ්ඩ නිපදවන්නෙකුට, සිය විකුණුම් සහ ලාභදායිත්වය වැඩිකර ගැනීම සඳහා, අදාල වෙනත් අනුපූරක භාණ්ඩ සඳහා වන හරස් ඉල්ලුම් නම්‍යතාවය විශ්ලේෂණය කිරීම මගින් එවන් උපාය මාර්ගික මිල වෙනස් කිරීමේ තීරණ වලට එලඹිය හැකිවීම දැක්විය හැක.

රජය විසින් වක්‍ර බදු පනවනු ලැබීමේදී, ආදේශක සහ අනුපූරක වන භාණ්ඩ මත එසේ වනවනු ලබන භාණ්ඩ බදු වෙතින් ඇතිකරන බලපෑම අධ්‍යයනය කිරීමටද මෙම සංකල්පය ප්‍රයෝජනවත් වේ. නිදසුනක් ලෙස, දුම්කොළ මත වක්‍ර බද්දක් පැනවීමේදී, එමගින් එහි ආදේශක සහ අනුපූරක භාණ්ඩ වන මිල ගණන් වල සිදුවන වෙනස්වීම් අධ්‍යයනය කිරීම මගින්, ජාතික සෞඛ්‍යය ගැටලු අවම කිරීම සඳහා දුම්කොල නිෂ්පාදනයන් මත පනවනු ලබන වක්‍ර බදුවල සාර්ථකත්වය ඇගයීම කල හැකි වීම දැක්විය හැකිය.

ඊටත් අතිරේකව, ආදේශක භාණ්ඩ සහ අනුපූරක භාණ්ඩ වර්ගීකරණයටත් මෙම සංකල්ප යොදා ගැනීම මගින් එකී භාණ්ඩ ප්‍රභේද දෙක සම්බන්ධ වෙන්වූ අධ්‍යයනයන්ටද එය භාවිතයට ගත හැකිය.

## <u>පිළිතුර අංක 03</u>

(අ)

| පූර්ණ තරඟය | ඒකාධිකාර තරඟය |
|---|---|
| සමානතා : | |
| 1. පවත්නා ආයතන ගණන විශාලය | 1. පවත්නා ආයතන ගණන විශාලය |
| 2. ආයතන සඳහා අබාධ පිවිසුමත්, ඉවත්විය හැකිවීමත් ක්‍රියාත්මක කෙරේ. | 2. ආයතන සඳහා අබාධ පිවිසුමත්, ඉවත්විය හැකිවීමත් ක්‍රියාත්මක කෙරේ. |
| 3. ආයතන එකිනෙක තරඟ කරයි. | 3. ආයතන එකිනෙක තරඟ කරයි. |
| 4. ආන්තික පිරිවැය, ආන්තික අයභාරයට සම වීමේදී සම ප්‍රභේදන ලක්ෂ්‍යය හඳුනාගැනේ. | 4. ආන්තික පිරිවැය, ආන්තික අයභාරයට සම වීමේදී සම ප්‍රභේදන ලක්ෂ්‍යය හඳුනාගැනේ. |
| 5. කෙටි කාලයේදී, අධිලාභ ලැබීම හෝ කෙටිකාලීන පාඩුලබන තත්වයන්ට මුහුණ දී සිටීම ආයතන වෙතින් දැකිය හැකි වන අතර දිගුකාලයේදී ආයතන, ප්‍රමාණික ලාබ පමණක් ලබයි. | 5. කෙටි කාලයේදී, අධිලාභ ලැබීම හෝ කෙටිකාලීන පාඩුලබන තත්වයන්ට මුහුණ දී සිටීම ආයතන වෙතින් දැකිය හැකි වන අතර දිගුකාලයේදී ආයතන, ප්‍රමාණික ලාබ පමණක් ලබයි. |

| අසමානතා : | |
|---|---|
| 1. සෑම ආයතනයක් විසින්ම සමජාතිය භාණ්ඩයක් නිපදවන හෙයින්, මිලදීගන්නන් වෙතින් කිසිම ආයතනයක් ඉදිරිපත් කරන භාණ්ඩ කෙරෙහි විශේෂත්වයක් ජනිත නොවේ. | 1. මෙහිදී තරඟකරුවන් අතර, ඔවුන් ඉදිරිපත් කරනු ලබන භාණ්ඩයන් සම්බන්ධයෙන් වන අසමානතා පවතී. ඒ ඒ ආයතනය ඉදිරිපත් කරන භාණ්ඩ බොහෝ දුරට සමාන වුවද ඒවා සමජාතිය භාණ්ඩ නොවේ. එහෙත් ඒවා ලඟ ආදේශක ලෙස පමණක් සැලකිය හැකිය. |
| 2. කර්මාන්තයේම මිල තීරණය වනුයේ ඉල්ලුමේ සහ සැපයුමේ බලපෑම මතයි. සෑම ආයතනයක්ම, මෙසේ වෙළඳපලේ තීරණය වන මිලට සිය භාණ්ඩ අලෙවිකල යුතුවේ. එම නිසා, සෑම ආයතනයක්ම මිල ගනුවෙක් (Price taker) වන අතර ප්‍රමාණය පිළිබඳ පමණක් තීරණ ගන්නෙක් වේ. | 2. සෑම ආයතනයක් සඳහාම, එයට අදාල මිල ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. ඒ ඒ ආයතනය පාලනය කල හැක්කේ කර්මාන්තය සඳහා වන සමස්ථ වෙළඳපලෙන් කුඩා කොටසක් පමණි. |
| 3. ප්‍රස්ථාරික වශයෙන්, ආයතනයේ ඉල්ලුම් වක්‍රය (සාමාන්‍ය අයභාර වක්‍රය) පූර්ණ නම්‍ය වූ රේඛාවක් වේ. එහි ආන්තික අයභාර වක්‍රයද ඒ මතම සමපාතවේ. | 3. ආයතනයක ඉල්ලුම් වක්‍රය (සාමාන්‍ය අයභාර වක්‍රය) නම්‍ය එකක් වන අතර එය වමේ සිට දකුණට බෑවුම් වන්නක් වේ. ඒ අනුව එහි ආන්තික අයභාර වක්‍රය එම සාමාන්‍ය අයභාර වක්‍රයට පහතින් පිහිටයි. |
| 4. සමතුලිත තත්වයේදී MC= MR වන අතර P= AR= MR වන හෙයින් එම තත්වයේදී මේ සියල්ල එකට සමානවේ. | 4. සාමාන්‍ය අයභාර වක්‍රය වමේ සිට දකුණට බෑවුම් වන හෙයින් ඊට අනුරූපව MR වක්‍රය ඊට පහතින් පිහිටයි. ඒ අනුව සමතුලිත තත්වයේදී AR>MR = MC වේ. |
| 5. මෙහිදී, භාණ්ඩ ප්‍රභේදනයක් නොමැති නිසා, අලෙවිය පිළිබඳ ගැටලුවක් නොමැත. එම නිසා ම විකුණුම් පිරිවැයක අදාල නොවේ. වෙළඳපල පවත්නා මිලට, ඕනෑම ප්‍රමාණයක් ආයතනයට අලෙවිකල හැකිය. | 5. භාණ්ඩ ප්‍රභේදනය ක්‍රියාත්මක නිසා විකුණුම් පිරිවැයක් දැරීම අනිවාර්ය වේ. එමගින්, අනෙකුත් ආයතන වල භාණ්ඩ මිලදී ගනු වෙනුවට තම නිෂ්පාදිතය මිලදී ගැනීම සඳහා ගනුවා පෙළඹවීමට ආයතනය උත්සාහ කරයි. |
| 6. මෙහිදී ආයතනයේ නිමවුම, ඒකාධිකාර තරගයේ ආයතනිය නිමවුමට වඩා වැඩි අතර, නිමවුම සඳහා වන මිල, ඒකාධිකාර තරගයේ ආයතනීය මිලට වඩා අඩුය. | 6. මෙහිදී ආයතනීය නිමවුම, පූර්ණතරඟකාර ආයතන නිමවුමට වඩා අඩුවන අතර ආයතනීය මිල, ඊට වඩා වැඩිය. |

(ආ) <u>මිල විශේෂණය</u>

මිල විශේෂණය යනු, එකම භාණ්ඩය හෝ සේවාව සඳහා වෙන් වෙන්වූ පාරිභෝගිකයාගෙන් (ගනුවාගෙන්) එකිනෙක පාරිභෝගිකයාට වෙනස් වෙනස් මිලක් නියම කෙරෙන පරිදි මිල තීරණය කිරීමේ උපාය මාර්ගයයි. ශුද්ධ මිල විශ්ලේෂණයේදී විකුණුම්කරු විසින් ගැනුම්කරු ගෙවීමට කැමති උපරිම මිල අයකරයි.

මිල විශේෂණය සාර්ථක වීම සඳහා වන කොන්දේසි .

මිල විශේෂණය සාර්ථක වනුයේ අපූර්ණ තරගකාර තත්වයන් යටතේය. වෙළඳපලේ පවත්නා අපූර්ණත්වයේ ප්‍රමාණය මත, මිල විශේෂණය ක්‍රියාත්මක කිරීම තීරණය වේ. එම නිසාම, ඒකාධිකාර වෙළඳපල තත්වයන්හි හෝ එකම භාණ්ඩය හෝ සේවය සපයන විවිධ ආයතන අතර පොදු එකගත්වයන් පවතින තත්වයන්හිදී, මිල විශේෂණය බොහෝවිට අත්දැකිය හැකිය.

(i) ඒකාධිකාර බලයක් පැවතීම

මිල විශේෂණය ක්‍රියාත්මක කිරීම සඳහා, නිෂ්පාදකයා, සැපයුම සහ බෙදාහැරීම පාලනය කරන්නෙකු විය යුතුය. එසේ වන්නේ, අදාල නිෂ්පාදිතය, වෙළපලෙහි වෙනත් ස්ථාන වලින් ලබාගැනීමට ඇතිවිය හැකි හැකියාව නැතිකරීමටයි. එම නිෂ්පාදනය වෙනත් ස්ථානවලින් ලබාගැනීමට හැකිනම් මිල විශේෂණය සාර්ථක නොවේ.

(ii) මිල දීගෙන නැවත අලෙවි කිරීමේ හැකියාව නොතිබීම. අඩුමිලකට මිලදීගෙන වැඩිමිලකට එය විකිණිමට හැකියාවක් වෙළඳපලේ නොතිබිය යුතුය. එසේ වුවහොත් මිල විශේෂණය සඳහා ඉලක්ක කරගෙන සිටින පාර්ශවයන්ට, වෙනත් ස්ථානයකින් එය ලබාගත හැකි වනු ඇත. මෙම කොන්දේසිය, සේවාවන් සම්බන්ධයෙන් විශේෂ වශයෙන් අදාල වේ. නිදසුනක් ලෙස, පුද්ගලික චැනල් කිරීම මගින් වෛද්‍යවරුන්ගෙන් ලබාගන්නා වෛද්‍ය සේවය දැක්විය හැකිය.

(iii) වෙළඳපලවල් අතර නිදහසේ තොරතුරු ගලායාම සිදු නොවීම. මිල විශේෂණ සාර්ථක වීම සඳහා ඉහල මිලකට නිෂ්පාදිතය මිලදිගන්නන් වෙත, එම නිෂ්පාදිතය වෙනත් වෙළඳපලක, වෙනස්වූ පහල මිලකට අලෙවිකෙරෙන බවේ තොරතුරු සංනිවේදනය නොවිය යුතුය. එසේ නොවුවහොත් පාර්භෝගිකයා, එකී පහල මිල ගණන් පවතින වෙළඳ පලට යොමුවීම හෝ නිෂ්පාදිතය ප්‍රතික්ෂේප කරීමට පෙලඹීම සිදුවිය හැකිය.


(iv) අදාල වෙළඳපලවල් වෙන්වූ ඒවා විය යුතුය.

වෙළඳපලවල්, ප්‍රධාන වශයෙන්, ආදායම්හි වෙනසේ පදනමින්, වෙන්වූ ඒවා විය යුතුය. එවිට, වෙනස් වූ මිල ගණන් අයකල හැකිවේ. එසේම, ආදායම් මට්ටමහි වෙනස්කම් පවත්නා විටදී, එකම නිෂ්පාදිතය , එකම ප්‍රදේශයකදී විවිධ මිලට අලෙවි කල හැකිය. නිදසුනක් ලෙස, ඉහල මිලගණන් අයකරන වෛද්‍යවරයෙකු, අඩු ආදායම් ලාභීන්ගෙන් පහල මිලක් අයකරන අතර, හොද වෛද්‍ය සේවා සඳහා ඉතා අනම්‍ය තත්වයක් ක්‍රියාත්මකවන ඉහල මිලක් අයකිරීම දැක්විය හැකිය. එසේම. දේශීය සහ විදේශීය වෙළඳපල දෙකක් සහිත නිෂ්පාදකයෙකුට ඒ අනුව මිල විශේෂණය ක්‍රියාත්මක කළහැකිය.


(v) විවිධ වෙළඳපලවල්හි, වෙනස් වෙනස් මිල ඉල්ලුම් නම්‍යතා තත්වයන් පැවතීම.

එනම්, ඒකාධිකාරයෙකු භාණ්ඩ අලෙවිකරන වෙළඳපලවල්හි, වෙනස් මිල ඉල්ලුම් නම්‍යතා තත්වයන් පැවතිය යුතුය යන්නයි. එක් වෙළඳපලක එය නම්‍යවන අතර අනිකට සාපේක්ෂව අනම්‍ය විය යුතු බවයි.

(ඇ) මිල විශේෂණය සහ පාරිභෝගික අතිරික්තය.




මිල විශේෂණයක් නොමැති වෙළඳපල තත්වය යටතේ, ඒකක 2 ක් එකම මිලකට අලෙවි කිරීම




මිල විශේෂණයක් සහිතව එකී ඒකක 2, මිල ගණන් දෙකකට විකිණීම.

ඉහත දෙවන සටහන අනුව, මිල විශේෂණය ක්‍රියාත්මක කිරීම සමග ප්‍රථම සටහනෙන් පෙන්වන පාරිභෝගික අතිරික්තය අඩුවන ආකාරය පැහැදිලි වේ.

## <u>පිළිතුර අංක 04</u>

(අ) රජයේ සාර්ව ආර්ථික අරමුණු යනු, රජය සාක්ෂාත්කර ගැනීමට අපේක්ෂාකරන ආර්ථික ඉලක්කයන්ය ( Goals), මෙම අරමුණු වලින් අපේක්ෂා කරනුයේ ආර්ථිකය යහපත් තත්වයක පවත්නා බව තහවුරු කිරීමයි. ඒ අනුව මෙම අරමුණු ප්‍රධාන කාණ්ඩ දෙකකින් දැක්විය හැකිය.

(i) වර්ධනය හා සම්බන්ධ අරමුණු, උදාහරණ :ආර්ථික වර්ධනය. වේගවත් ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම තුලින් සේවා වියුක්ති ගැටලුවටද විසඳුමක් ලබාදේ.

(ii) ස්ථායිතාව හා සම්බන්ධ අරමුණු. උදාහරණ : බාහිර ස්ථායිතාව පවත්වා ගැනීම නැතහොත් විදේශ විනිමය අනුපාතිකයේ ස්ථායිතාව පවත්වා ගැනීම සහ දේශීය (අභ්‍යන්තර) ස්ථායිතාව පවත්වාගැනීම නැතහොත් උද්ධමනය පාලනය කිරීම.

(ආ) (i) රාජ්‍ය අංශයේ ක්‍රියාකාරීත්වය, මෙහෙයුම් සහ අධීක්ෂණ කාර්ය භාරයකට සීමාකිරීම. (Limit of regulatory and supervisory role)

(ii) ප්‍රතිපලදායී නොවන (Unproductive) ක්‍රියාකාරකම් සඳහා දැරෙන නාසතිකාර වියදම් සීමාකිරීම සහ රාජ්‍ය සුබසාධන වැඩ සටහන්, අවශ්‍යයෙන්ම සුබසාධනය හිමිවිය යුතු අයට පමණක් සීමා කිරීම.

(iii) කාර්යක්ෂමතාවය නැංවීම තුලින් රාජ්‍ය අංශයේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම.

(iv) සෘජු විදේශ ආයෝජන දිරිගැන්වීම සහ ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් රාජ්‍ය-පෞද්ගලික අංශ සහභාගිත්වය (Public # Private Partnership ) වැඩි කිරීම.

(ඈ) රාජ්‍ය වියදම් අඩුකිරීම සහ රාජ්‍ය ආදායම් වැඩිකිරීම යන මාර්ග දෙකෙන්, අයවැය හිඟය අඩුකල හැකිය. එකී පියවර ගැනීම මගින් පහත දැක්වෙන සාර්ව ආර්ථික අරමුණු සාක්ෂාත් කරගත හැකිය.

(i) අයවැය හිඟය අඩුවීම හේතුවෙන් සිදුවන රාජ්‍ය ණය ගැනීම අඩුවීම මත, සමස්ථ රාජ්‍ය ණය ප්‍රමාණ වර්ධන වේගය පහත වැටීම. රාජ්‍ය වියදම් අඩුකිරීම සිදුවනුයේ රාජ්‍ය පුනරාවර්තන වියදම් අඩුකිරීම මගින් නම් යම් වැඩිපුර සම්පත් ප්‍රමාණයක්, ප්‍රාග්ධන වියදම් සඳහා යොමුකල හැකිවීම.

(ii) නව බදු පැනවීම වැනි නව ආදායම් මාර්ග නිසාත්, රාජ්‍ය වියදම් සීමාකිරීම නිසාත් ආර්ථිකයේ සමස්ථ ඉල්ලුම පහත වැටීම හේතුවෙන්, උද්ධමනය පහත වැටීමේ තත්වයක් ඇතිවීම.

(iii) ආර්ථිකයේ සමස්ථ ඉල්ලුම පහත වැටීම, ආනයන සඳහා වන ඉල්ලුමේ අඩුවීමද නියෝජනය කරනු ඇත. දේශීය මිල උද්ධමනය අඩුවීම (නැතහොත් දේශීය නිෂ්පාදිත වල නිෂ්පාදන පිරිවැය පහත වැටීම) මගින්, අපනයනය කරනු ලබන භාණ්ඩ සඳහා පවතින මිල ඉල්ලුම් නම්‍යතාවය අනුව, අපනයන සඳහා වන ඉල්ලුමේ වැඩිවීමක්ද අපේක්ෂා කලහැකිය. මෙසේ ආනයන පහත වැටීම සහ අපනයන වර්ධනය හේතුවෙන් ගෙවුම් ශේෂ ගැටලුවේ ලිහිල් වීමක් ඇතිවීම.

(iv) අයවැය හිඟය අඩුකිරීම මත, රාජ්‍ය ණය ගැනීම අඩුවීම හේතුවෙන්, ආර්ථිකයේ පවත්නා ණය දීමේ හැකියාව (Credit available in the economy) පෞද්ගලික අංශයේ ආයෝජනයන් සඳහාවන ණය දීම් සඳහා යොදාගැනීම හේතුවෙන් නව රැකියා ඉඩප්‍රස්ථා බිහිවීම සහ භාණ්ඩ සුලබ වීම.

(v) රාජ්‍ය ණය ගැනීම අඩුවීම හේතුවෙන්, පොලී අනුපාතික ඉහල යාමට පැවති පීඩනය අඩුවීම හේතුවෙන්, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැදුම්කර හා සම්බන්ධ පොලී අනුපාතික පහලයාම සහ ඒ නිසාම ආර්ථිකය තුල පහල පොලී අනුපාතික පවත්නා තත්වයක් (Low Interest Regime) ඇතිවීම.

(vi) රාජ්‍ය ආදායම නැංවීම සඳහා රජය නව බදු හඳුන්වාදීම සිදුකිරීම සහ බදු ගෙවීම් පැහැර හැරීම් වලක්වා ගැනීමට ගන්නා පියවර මගින්, ආදායම් ව්‍යාප්ති විෂමතා තත්වය යම් ප්‍රමාණයකට පහත වැටීමට බලපෑමක් ඇතිවීම.

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව වැනි ජාතික වශයෙන් වැදගත් වන උපයෝගිතා සේවා සපයන රාජ්‍ය ව්‍යාපාර වෙතින් දිගින් දිගටම දැරෙන පාඩු, රාජ්‍ය අයවැය ලේඛණය මත ඉහල බරක් පැටවීමට හේතුවන බැවින්, ඒ නිසාම රාජ්‍ය අයවැය හිඟය තවදුරටත් ඉහල යාම හෝ යම් යම් වැදගත් නව ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති ආරම්භ කිරීම අත්හැර දැමීමට සිදුවීම හෝ ඒවායේ ආරම්භය කල් දැමීමට සිදුවීම. ඉහත සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීම නිසා අත්දකින්නට සිදුවීම. මේ හේතුවෙන් ආර්ථිකයේ උද්ධමනකාරී තත්ත්වයක් හෝ ආර්ථික සංවර්ධනයේ මන්දගාමී තත්ත්වයක් ඇතිවේ.

## <u>පිළිතුර අංක 05</u>

(අ) මූල්‍ය පද්ධතිය තුලට ගැනෙන මල්‍ය ආයතන.

(i) වාණිජ බැංකු
(ii) අනෙකුත් විශේෂ සේවා සලසන බැංකු (Other Specialied Banks)
(iii) මූල්‍ය සමාගම්
(iv) කල්බදු සමාගම් (Leasing Companies)

(අ)(i) ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය.

රටේ පවත්නා විනිමය අනුපාත ක්‍රමය (Exchange Rate Regime) තුල, නිල විනිමය අනුපාතිකය (Official Exchange Rate) රජය හෝ මහබැංකුව විසින් වෙනත් රටක ව්‍යවහාර මුදල (උදා: ඇමෙරිකානු ඩොලරය) සමග සම්බන්ධ කර පවත්වාගෙන යන තත්වයයි. මෙම ස්ථාවර විනිමය, අනුපාත ක්‍රමයේ අරමුණ වන්නේ, දේශීය ව්‍යවහාර මුදලේ විදේශීය වටිනාකමේ වෙනස් වීම ඉතා පටු පරාසයකට සීමාකර පවත්වා ගැනීමයි.

(ii) පාවෙන විනිමය අනුපාත ක්‍රමය.

රටේ පවත්නා විනිමය අනුපාතික ක්‍රමය තුල, දේශීය ව්‍යවහාර මුදලේ විදේශ වටිනාකම, එම ව්‍යවහාර මුදලට, අනිකුත් ව්‍යවහාර මුදල් සාපේක්ෂව පවත්නා, විදේශ විනිමය වෙළඳපල ඉල්ලුම සහ සැපයුම අනු තීරණය වන තත්වයයි. ඒ අනුව පාවෙන විනිමය අනුපාතිකය, විදේශ විනිමය වෙළඳපලේ ක්‍රියාකාරිත්වය මත නිදහසේ වෙනස් වේ.

(ඇ) (i) ප්‍රාග්ධන වෙළඳපල යනු, දිගුකාලීන ණය සහ හිමිකම් ප්‍රාග්ධනය (Equity) හා බැදුනු සුරකුම්පත් මිලදී ගැනෙන සහ අලෙවි කරන මූල්‍ය වෙළඳපලයි. මෙම වෙළඳපල තුලින්, දිගුකාලීන ආයෝජනයන් සදුකරන රජය හෝ සමාගම් සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය, දිගුකාලීන ප්‍රතිලාභ අපේක්ෂාවෙන් සිය ඉතරුම් ආයෝජනය කිරීමට සුදානම් ඉතිරිකරන්නන්ගේ අරමුදල් තුලින් ලබාදීමේ කාර්යය ඉටුකරයි.

(ii) (අ) ප්‍රාග්ධන කොටස් (Stocks / Shares)

(ආ) ණයකර (Debentures)

(ඇ) බැදුම්කර (Bonds)

(ඇ) ආදායම් වෘත්තාකාර ප්‍රවාහයක් තුල සමතුලිත තත්වයක් පවත්නේය යනු එම පවත්නා තත්වය තුල ආදායම් මට්ටමේ හෝ වියදම් හෝ නිමවුම් මට්ටමේ වෙනස් වීමකට ප්‍රවනාතාවයක් නොපවත්නා බවයි. එනම් :

සමස්ථ ආදායම (Y) = සමස්ථ වියදම (E) = සමස්ථ නිමවුම (O) වශයෙන් දැක්වෙන තත්වයයි.

නූතන ආර්ථිකයක ප්‍රධාන අංශ 4 කින් සැකසී ඇත. එනම් (i) කුටුම්භ අංශය (ii) ආයතන හෝ නිමවම් අංශය (iii) රාජ්‍ය අංශය (iv) බාහිර ලෝකය යන අංශ 4 යි.

මෙම අංශ 4 න් සැදුනු නූතන ආර්ථික ක්‍රමයන්හි, ආදායමේ වෘත්තාකාර ප්‍රවාහය තුළ, යම් යම් විදීම් (Injections) සහ ගිලහීම් (Withdrawals) ස්ථාන ගතවේ. ඒ අනුව, ඉහත සඳහන් සමතුලිතතා තත්වය ලගාවනුයේ එසේ සිදුවන සියලුම විදීම්වල සමස්ථ එකතුව, සියලුම ගිලිහීම් වල සමස්ථ එකතුවට සමාන වන තත්වයන් ඇතිවීම මගිනි.

නූතන ආර්ථිකයක එවන් විදීම් වනුයේ, ආයෝජන (I) , රාජ්‍ය වියදම් (G) සහ අපනයනයන්ය (X) . ගලිහීම්වනුයේ, ඉතිරිකිරීම් (S), බදු (T) සහ ආනයනයන්ය (M). ඒ අනුව, සමස්ථ විදීම් , සමස්ථ ගිලිහීම් වලට සමානවීමේදී, එනම්, I+G+X=S+T+M ආදායම් වෘත්තාකාර ප්‍රවාහයේ සමතුලිතා තත්වය තීරණය වේ.

## පිළිතුර අංක 06

(අ) (i) ඉහල සේවක පිරිවැටුම

(ii) රැකියාවට නොපැමිණිම

(iii) අඩු ඵලදායකත්වය

(iv) කලට වේලාවට වැඩ නොකිරීම

(v) කම්මැලිකම

(vi) කාර්යයෙහි ගුණාත්වය අඩුවීම සහ අපතය

(vii) දුර්වල අන්තර්පුද්ගල සබදතා සහ ගැටුම්

(viii) කාර්මික අසහනය / වැඩ වර්ජන

(ආ) (i) ශාරීරික අවශ්‍යතා (Physiological needs) උදාහරණ : ආහාර, ඇඳුම්පැළඳුම්, නිවාස සහ විවේකය පිළිබඳ අවශ්‍යතා.

(ii) ආරක්ෂක අවශ්‍යතා (Safty Needs) උදාහරණ : පෞද්ගලික සුරක්ෂිතභාවය සහ ආර්ථික සුරක්ෂිතතාවය / රැකියා සුරක්ෂිතතාවය

(iii) සාමාජයීය අවශ්‍යතා. උදාහරණ : කණ්ඩායමකට ඇතුලත්වීමේ අවශ්‍යතාවය , මිත්‍රත්වය

(iv) ගරුත්ව අවශ්‍යතා (Esteem needs) උදාහරණ : පිළිගැනීම, ගරුත්වය සහ මමත්වය.

(v) ආත්ම පරිපූර්ණ අවශ්‍යතා (Self actualisation) උදාහරණ : පුද්ගලයෙකුට, තම හැකියා සහ දක්ෂතා යටතේ ලගාවිය හැකි උපරිම ස්ථානයකට ලගාවීමේ අවශ්‍යතාවය.

(ඇ) (i) රැකියා පෝෂණය (Job Enrichment)

රැකියාවේ වගකීම වැඩිවන ක්‍රියාවන් සහ අභියෝගාත්මක ක්‍රියාවන් සේවකයාට ලබාදීම, රැකියා පෝෂණය ලෙස දැක්වේ. මේ හේතුවෙන් රැකියාව සම්බන්ධ ඉහල නිදහසක් සහ ගුණාත්මක බව පවත්වා ගැනීමේ අවස්ථාවක් සේවකයාට ලැබෙන නිසා, ඔහුගේ විවිධ හැකියා භාවිතයට ගැනීමට හැකිවීමෙන් ඔහු අභිප්‍රේරණය කිරීම මෙහි අරමුණයි. මෙය රැකියාවේ සිරස පුළුල් කිරීම (Vertical Loadig or Vertical Expansion) ලෙස හැඳින්වේ. මෙමගින් රැකියාවේ වගකීම ලබාදීම සේවකයා පිළිගැනීමට ලක්කිරීම, වර්ධනයට ඉඩප්‍රස්ථා ලබාදීම, ඉගෙන ගැනීමට අවස්ථා ලබාදීම, ජයග්‍රහණය කරා ගමන් කිරීමට සහ එය සාක්ෂාත් කර ගැනීමට ඉඩ ප්‍රස්ථා ලබාදීම තුලින් සෙවකයා වෙත උසස් මට්ටමේ අභිප්‍රේරණයන් සැලසෙන බව පිළිගැනේ.

(ii) රැකියා විස්තරණය (Job Enlargement)

රැකියා මට්ටමේ වෙනසක් නොමැති, එකම සීමාව තුල එක්සේවකයෙකු කලයුතු කාර්යයන් ගණන වැඩිකිරීම සහ ඊට අනුරූපීව වගකීම වැඩකිරීම මගින් රැකියා විසතාරණයක් කිරීම මෙහිදී සිදුවේ. මෙම තතවය, රැකියාවේ තිරස් පුළුල් වීම (Horizontal Loading or Horzontal Expansion) ලෙස දැක්වේ. මෙම තත්වය ශ්‍රම විභාජනය සහ විශේෂ ප්‍රාගුණය කරණයේ මූලධර්ම වලට පටහැනිය. ශ්‍රම විභාජනයේදී සහ විශේෂ ප්‍රාගුණයකරණයේදී, කලයුතු කාර්යයන් කුඩා කොටස් වලට වෙන්කර බෙදා දක්වා, ඒ ඒ කඩා කාර්යයන් ඒ ඒ සේවකයාට පැවරීම මගින්, වගකීම් පැහැදිලිව නිශ්චිතව දැක්වීමද සිදුවේ. ඒ අනුව රැකියා විස්තරණයේදී සිය අතිරේක කාර්යයන් ඉටුකිරීමට, සේවකයාට විශේෂ නව කුශලතා අත්කරගැනීමක් අවශ්‍යතාවයක් ඇති නොවේ. මේ නිසා රැකියා පෝෂණයේදී ලැබෙන අභිප්‍රේරණ ප්‍රතිලාභ මෙහිදී අත්නොවේ. සේවකයෙකු, නිෂ්පාදිතයක් සමබන්ධයෙන්, එකම කාර්යය දිගින් දිගටම ඉටුකිරීම වෙනුවට, නිෂ්පාදන අයිතමයකට අදාල කාර්යයන් ගණනාවක්ම කලයුතු වේ. ඒ අනුව, දිගින් දිගටම සිදුවන රැකියා විස්තාරණය මගින්, ඉටුකළ නොහැකි තරමේ කාර්යය භාරයක් සේවකයා මත පැටවීම (Job Creep) සිදුවිය හැකිය.

<u>පිළිතුර අංක 07</u>

(අ) උපාය මාර්ගික පාලන පද්ධතියක වැදගත් මූලිකාංග.

(i) පාලනය කලයුත්තේ කුමක්ද යන්න තීරණය කිරීම. ආයතනය එමගින් සාක්ෂාත් කරගැනීමට අදහස් කරන්නේ කුමක්ද ?

(ii) පාලන ප්‍රමිති (Control Standards) නිශ්චය කිරීම. ඉලක්ක සහ ඉඩදෙන සීමාවන් කවරේද?

(iii) කාර්ය සාධනය මැන දැක්වීම. තථ්‍ය කාර්ය සාධනය කුමක්ද ?

(iv) තථ්‍ය කාර්ය සාධනය, ප්‍රමිතීන් සමග සැසඳීම. තථ්‍ය අගයන් සැලසුම් සමග කෙතෙක් දුරට එකඟ වේද ?

(vi) විචලතා සඳහා වු හේතු නිශ්චය කිරීම. විචලතා වලට හේතුව අභ්‍යන්තර දුර්වලතාද නැතහොත් ආයතනයේ පාලනයෙන් බැහැර වු හේතුන්ද ?

(vii) නිවැරදි කිරීමේ පියවර ගැනීම. නිවැරදි කිරීම්, අභ්‍යන්තර දුර්වලතා නිවරදි කිරීම සඳහාද නැතහොත් බාහිර සාධක වල බලපෑම නිසා අරමුණු වෙනස් කල යුතුද ?

(ආ) (i) සුපරීක්ෂණ පාලනය - මෙමගින් සලකා බලනුයේ, සිය අධීක්ෂණය යටතට ගැනෙන කාර්ය මණ්ඩලය (Subordinates) හා සම්බන්ධව සලකා බැලීමේදී, අධීක්ෂණ නිලධාරියාගේ චර්යාවයි. මෙහිදී පාලනය ( Conrtrol) පවත්වා ගැනෙනුයේ, අධිකාරිය ලද්දෙකු විසින් , සිය අධීක්ෂණය යටතට ගැනෙන සේවකයන්ගේ චර්යාව අධීක්ෂණය කිරීම මගිනි. ඒ අනුව, අධීක්ෂකයෙකු වශයෙන්, කළමණාකරුවෙකුගේ මූලිකතම කාර්යය වනුයේ, අවශ්‍ය මග පෙන්වීම, උපදෙස් ලබාදීම සහ මෙහෙය වීම සිදු කරමින් (Giving direction and guidance) සිය යටත් නිලධාරින්ගේ චර්යාව නිරීක්ෂණය කිරීමයි.

(ii) සුපරීක්ෂණ පාලන පරිසරයක, ප්‍රධාන පාර්ශව දෙකක් සිටිති. එනම්, අධීක්ෂණ නිලධාරියා (Supervisor) සහ ඔහුගේ අධීක්ෂණය යටතට ගැනෙන සේවක කාර්ය මණ්ඩලයයි (Subordinates). ඒ අනුව, සුපරීක්ෂණ පාලනය සඵලවත් එකක් වීමට නම්, මූලික වශයෙන්, අධීක්ෂණ නිලධාරියා, පුළුල් දැනුමක් සහිත, පවරන ලද කාර්යයෙහි ප්‍රවීන, අවබෝධය සහිත, සංනිවේද කුශලතා සහ කාර්ය සාධන කුශලතා සහිත පුද්ගලයෙකු විය යුතුය. අනෙක් අතට කාර්යය සඵලවත් වීම සඳහා ඔහු, යටත් කාර්ය මණ්ඩලයේ පිළිගැනීමට භාජනය වන පුද්ගලයෙකු විය යුතු වන අතර, ඔහු හා පවත්නා බැඳීම, ඔවුනගේ පිළිගැනීමට භාජනය වන එකක්ද විය යුතුය. මේ අනුව, යටත් කාර්ය මණ්ඩලය අධීක්ෂණ නිලධාරියාට වඩා දැනුම සහ අවබෝධය ඇති තත්වයක් පවතී නම්, සුපරීක්ෂණ පාලනය අසාර්ථක තත්වයට පත්වේ.

(ඇ) පාලන පද්ධතියක් නිර්මානය කිරීමේදී, සලකා බැලිය යුතු සාධක.

(i) භෞතික වශයෙන් ක්‍රියාත්මක කළහැකි, පාලනයේ ප්‍රමාණය.

(ii) පිරිවැය/ප්‍රතිලාභ තත්වය, එනම් වැය දැරිය හැකි බව සහ අපේක්ෂිත ප්‍රතිලාභ වෙතින් දැරෙන පිරිවැය සාධාරණීය කෙරෙන බව.

(iii) කාර්යය සඳහා නියුක්ත කෙරෙන පුද්ගලයන්ගේ ස්වභාවය අදාල කාර්යය සඳහා නියුක්ත කර ඇති පුද්ගලයන් විශ්වාසවන්ත නම් සහ ආයතනී අරමුණු සාක්ෂාත් කර ගැනීමට කැපවන්නන් නම්, ඔවුහු ස්වාධීනත්වයද අගයන බැවින්, අධීක්ෂණ පාලනයක් හඳුන්වාදීමට වඩා ස්වයංපාලනයකට ඉඩ සලසා දීම වඩා හිතකර වනු ඇත. එයින් පුද්ගල සංවර්ධනය මෙන්ම රැකියා තෘප්තිය වර්ධනය වීමද සිදුවනු ඇත.

(iv) පාලන පද්ධතිය හඳුන්වාදීමෙන් ඇතිවන අදාශාමාන බලපෑම (Impact). මෙයින් අදහස් වනුයේ, පාලන පද්ධතියක් හඳුන්වා දීමෙන් සේවකයන්ගේ රැකියා තෘප්තියට, කළමනාකරණය සම්බන්ධයෙන් පවත්නා ආකල්ප වලට, මෙන්ම ආයතනය කෙරෙහිද දක්වන පක්ෂපාතිත්වයට (Loyalty) සහ චිත්ත ධෛර්යට කවර ආකාරයක බලපෑමක් ඇතිවේද යන්න සලකා බැලිය යුතු බවයි.

(v) පාලනයේ ප්‍රමාණය, පාලන අවකාශය සහ පාලනයේ කෙරෙන ආකාරය යන අංශ වෙතින්, පාලන පද්ධතියට යටත්වන සේවකයන්, එම පද්ධතිය නෛතික වශයෙන් කොපමණ දුරට පිළිගැනීමට සුදානම්ද යන්න.

(vi) ආයතනයේ පරමාර්ථය ප්‍රමුඛතාවයන් සහ ආයතනීය වටිනාකම්, පාලන පද්ධතිය සමග කෙතරම් දුරට ගැලපේද යන්න.

CA | THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

# නිවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම˜" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු˜" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දැක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යොජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිඳු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයන්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.


[2] 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

**මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.**